# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2019

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

---

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

මෙය ලකුණු 20 ක අනිවාර්ය ප්‍රශ්නයකි. උසස් ගිණුම්කරණය විෂය නිර්දේශයේ ආවරණය කරමින් දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

(1.1) ශුද්ධ වැටුප පිළිබඳව ශිෂ්‍යයන්ගේ දැනුම පරීක්ෂා කර තිබූ අතර, 50% ක් පමණ නිවැරදිව උත්තර සපයා තිබුණි. සමහරු සේවක භාරකාර අරමුදලේ දායකත්වය (ETF) සහ සේවක අර්ථසාධක අරමුදලේ (EPF) 12% දායකත්වය දළ වැටුපෙන් අඩුකර තිබුණි. සමහරු සේවක භාරකාර අරමුදල 8% වෙනුවට 12% ක් අඩුකර තිබුණි. මේවා ප්‍රායෝගික ප්‍රශ්න බැවින් මෙවැනි ගණනය කිරීම් කෙරෙහි අයදුම්කරුවන් අවධානය යොමු කළ යුතුය.

(1.2) බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදිව උත්තර සපයා නොතිබුණි. මෙම ප්‍රශ්නයෙන් තොග වැඩියෙන් සටහන් වීම නිසා ලාභයට වන බලපෑම පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි.

(1.3) ණය සාධන පත්‍රවල ලක්ෂණ පිළිබඳව නොදන්නා නිසා බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා නොතිබුණි.

(1.4) බහුතරයක් මෙය නිවැරදිව ගණනය කර නොතිබුණි. උපචිත වියදම් සහ කලින් ගෙවීම් පිළිබඳව අයදුම්කරුවන්ට දැනුමක් නොමැති බව පෙනී යයි.

(1.5) මෙම ප්‍රශ්නයට වෙන්කර තිබූ ලකුණු දෙකම ලබා ගැනීමට බොහෝ අයදුම්කරුවන් අපොහොසත් වී තිබුණි. මෙම ප්‍රශ්නයෙන් ජංගම වගකීම් පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි.

(1.6) ශුද්ධ උපලබ්ධි අගය භාවිත කරමින් තොග ගණනය කිරීම පිළිබඳව පරීක්ෂා කර තිබුණි. බහුතරය නිවැරදි උත්තරය සපයා තිබුණද සමහරු රු.300,000/- ක කොමිස් මුදල අඩුකර නොතිබුණි.

(1.7) බහුතරය නිවැරදි උත්තරය සපයා නොතිබුණි. ඔවුන් අදාල නොවන උත්තර ලියා තිබුණි.

(1.8) අයදුම්කරුවන් බහුතරය සාර්ථකව උත්තර සපයා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

ණයගැති පාලන ගිණුම පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. මෙම කොටස පිළිබඳ දැනුම අඩු බව නිසා සුළු පිරිසක් සාර්ථක උත්තර සපයා නොතිබුණි. බොහෝ අයදුම්කරුවන් දෛනික විකුණුම් පොතෙහි එකතුව රු.20,000/-ක් වැඩිපුර එකතු කිරීම සහ රු.27,000/- ක ගැනුම් ඉන්වොයිසි වැරදීමකින් දෛනික විකුණුම් පොතේ ඇතුලත් කිරීම නිවැරදිව ගලපා තිබුණි. කෙසේවුවත්, රු.28,000/- නිවැරදිව පාලන ගිණුමේ වාර්තාකර ඇති බව ප්‍රශ්නයේ පැහැදිලිව දක්වා තිබුණ නමුත් සමහරු එයද පාලන ගිණුමේ ගලපා තිබුණි. සුළු පිරිසක් දුන් වට්ටම් ණයගැති පැලන ගිණුමේ හර සටහනක් ලෙස සලකා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 03

හවුල් ව්‍යාපාරයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබුණි. බොහෝ අයදුම්කරුවන් මූලධර්ම පිළිබඳ දැනුම අඩුකම නිසා විසර්ජන ගිණුමේ ගැනිලි පෙන්වා තිබුණි. සමහර අයදුම්කරුවන්ට ලාභ කොටස නිවැරදිව ගණනය කිරීමට අපොහොසත්ව තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 04

සාරාංශගත වැටුප් පත්‍රය සඳහා බහුතරය වැරදි උත්තර සපයා තිබුණි. ආකෘතිය ප්‍රශ්නය සමඟ දී තිබුණද ඔවුන් එම ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කර නොතිබුණි. ශුද්ධ වැටුප ගණනය කිරීමේදී අඩුකළ යුතු අයිතම මොනවාද යන්න පිළිබඳව සහ ශුද්ධ වැටුප් පදනම් කර ගනිමින් දළ වැටුප ගණනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඔවුන් දැන නොසිටියහ. ශුද්ධ වැටුපට එකතු කරනු වෙනුවට ඒවා නැවත අඩුකර තිබුණි. අයදුම්කරුවන් එම අගය මත සේවක අර්ථසාධක අරමුදල් දායකත්ව 8% සහ 12% එමෙන්ම සේවක භාරකාර අරමුදල 3% සහ සුභසාධන දායකත්වය වැරදි ලෙස ගණනය කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය දුර්වල මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 05

ගලපන ලද මුදල් පොත සහ බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි. සමහර අයදුම්කරුවන් මුදල් පොතට අදාල වන සටහන් හඳුනාගෙන නොතිබුණි. ඔවුන් එම සටහන් බැංකු සැසඳුම් ප්‍රකාශනයේ සඳහන් කර තිබුණි. සමහර අයදුම්කරුවන් මුදල් පොතේ ආරම්භක ශේෂය නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත් වී තිබුණි. මුදල් පොතේ ශේෂය ලබාගැනීමට බැංකු ප්‍රකාශනයේ ශේෂය පළමුව සළකන විට, උපලබ්ධි නොවූ චෙක්පත් එකතු කළ යුතු අතර, ඉදිරිපත් නොකළ චෙක්පත් අඩුකළ යුතුය. සමහරු මෙය මාරුකොට දක්වා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයෙන් සාමාජික දායක මුදල් ගිණුම පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. සමහර අයදුම්කරුවන් අවසාන ශේෂය නිවැරදිව වාර්තා කිරීමට අපොහොසත් වී තිබුණි. සමහරු වර්ෂය තුළ මුදල් ලැබීම් නිවැරදිව ගණනය කර නොතිබුණි. හිඟ සාමාජික මුදල් සහ කලින් ලැබුණු සාමාජික මුදල් සඳහා වන නිවැරදි සටහන් පිළිබඳව අයදුම්කරුවන් විසින් දැනගත යුතුය. සමහරු කලින් ලැබුණු සාමාජික මුදල් හර සටහනක් ලෙස සළකා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)
(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

ලාභ සඳහා නොවන සංවිධාන සඳහා ගිණුම්කරණය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් බහුතරයක් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබූ අතර, සුළු පිරිසක් පමණක් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත්ව තිබුණි. පහත දැක්වෙන වැරදි සහ දුර්වලතා නිරීක්ෂණය විය:

(1) **(a) කොටසින්** අවන්හලේ වෙළෙඳ ගිණුම පිළියෙල කිරීම අපේක්ෂා කළද, සමහර අයදුම්කරුවන් අවන්හල් වෙළෙඳ ගිණුම වෙනුවට සාමාජික දායක මුදල් ගිණුම පිළියෙල කර තිබුණි.

(2) ක්‍රීඩා සමාජය ලාභ සඳහා නොවන සංවිධානයක් වුවද, ක්‍රීඩා සමාජය විසින් පවත්වාගෙන යනු ලබන අවන්හල ලාභ අරමුණුකරගත් ව්‍යාපාරයක් බව බොහෝ අයදුම්කරුවන් අවබෝධ කරගෙන නොතිබුණි. එමනිසා, ඔවුන් අවන්හලේ ගැනුම්, විකුණුම් සහ ආරම්භක සහ අවසාන තොග, ආදායම් සහ වියදම් ගිණුමට ඇතුලත් කර තිබුණි. එය අවන්හලේ ලාභය ලෙස ආදායම් ප්‍රකාශනයේදී සැළකිය යුතු වේ.

(3) ණයහිමි පාලන ගිණුම පිළිබඳව ඇතැම් අයදුම්කරුවන්ගේ දැනුම දුර්වල මට්ටමක පැවතුණි. එමනිසා අවන්හලේ ගැනුම් නිවැරදිව ගණනය කිරීමට ඔවුන් අසමත්ව තිබුණි. ගැනුම්වල වටිනාකම සොයා ගැනීම සඳහා ණයහිමි පාලන ගිණුම පිළියෙල කිරීමේදී සමහර අයදුම්කරුවන් ආරම්භක සහ අවසාන ශේෂ, ණයහිමි පාලන ගිණුමේ වැරදි පැතිවල සටහන් කර තිබුණි. ණයහිමි පාලන ගිණුමේ සාමාන්‍යයෙන් බැර ශේෂයක් පවතින බව ඔවුන් නොදන්නා බව මින් පැහැදිලි වේ. තවද සමහර අයදුම්කරුවන් සැපයුම්කරුවන්ට ගෙවූ රු.24,200/- ගැනුම් ලෙස සටහන් කොට තිබුණි.

(4) සමහර අයදුම්කරුවන් වෙළෙඳ ගිණුම නිවැරදිව පිළියෙල කොට නිවැරදි ලාභය ගණනය කොට තිබුණි. නමුත් එම ලාභය ආදායම් සහ වියදම් ගිණුමට ගෙන නොතිබුණි.

(5) අවන්හලේ දළ ලාභය ගණනය කිරීමෙන් පසු එම ලාභයෙන් අඩුකළ යුතු වියදම් දෙකක් තිබුණි. නමුත් බොහෝ අයදුම්කරුවන් ඒවා අඩු කිරීමට අසමත්ව තිබුණි.

(6) සමහර අයදුම්කරුවන් වර්ෂයට අදාල සාමාජික මුදල්, විදුලිය සහ ක්‍රීඩා උපකරණ ක්ෂය නිවැරදිව ගණනය කිරීමට අසමත්ව තිබුණි.

(7) බොහෝ අයදුම්කරුවන් යාවජීව සාමාජික දායක අරමුදලින් 10% ක ආදායම නිවැරදිව ගණනය කිරීමට අසමත්ව තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 08

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළිබඳව මූලික දැනුම මද බව දක්නට ලැබුණි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළිබඳව මූලික දැනුමක්වත් අයදුම්කරුවන් තිබිය යුතුය. 80% කට වැඩි අයදුම්කරුවන් පිරිසක් මෝටර් රථය විකිණීමේ ලාභය නිවැරදිව ගණනය කොට නොතිබුණි.

නිරීක්ෂණය වූ පොදු වැරදි කිහිපයක් පහත දැක්වේ:

(1) මෝටර් රථය විකිණීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදිව වාර්තා කොට නොතිබුණි. බහුතරයක් රු.1,300,000/- ක විකුණුම් මුදල සැළකිල්ලට ගෙන නොතිබුණි.

(2) මෝටර් රථය විකිණීමේ ලාභය, ශුද්ධ ලාභයට ගලපා නොතිබුණි.

(3) මෝටර් රථය විකුණා තිබෙන්නේ පෙරදාතම චෙක්පතක් මගින් වන අතර, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිවැරදිව සටහන් කොට නොතිබුණි. බොහෝ අයදුම්කරුවන් එය මුදල් ශේෂයට එකතු කර තිබුණි.

(4) අවසාන තොගයේ පිරිවැය, ශුද්ධ උපලබ්ධි අගයට වඩා වැඩිය. නමුත් බොහෝ අයදුම්කරුවන් එය නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කොට නොතිබුණි. එසේම දී ඇති ශුද්ධ ලාභයට තොග ගැලපීමද කර නොතිබුණි.

(5) පිළිගත් ආකෘතියට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කර නොමැත.

(6) සමහරු වත්කම් සහ වගකීම් ලෙස කුමන අයිතම ඇතුලත් කළ යුතුදැයි නොදන්නා බව පෙනුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 09

හවුල් ව්‍යාපාර ගිණුම් පිළිබඳ මූලික දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ. ප්‍රාග්ධන ගිණුම සහ ජංගම ගිණුම් පිළියෙල කිරීම අවශ්‍ය විය.

හවුල් ව්‍යාපාර ගිණුම් පිළිබඳ මූලික දැනුම අඩු බව දැකිය හැකි විය. කීර්තිනාමය ගණනය කර එය ප්‍රාග්ධන ගිණුම්වලට ගැලපීම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදි. නමුත් අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් ප්‍රාග්ධන ගිණුම් හරහා නිවැරදිව ගලපා නොතිබුණි. සමහර අය ජංගම ගිණුම් හරහා ගලපා තිබුණි. බොහෝ අයදුම්කරුවන් ජංගම ගිණුම් නිවැරදිව පිළියෙල කොට නොතිබුණි. හවුල් ව්‍යාපාර පිළිබඳ මූලික දැනුම අයදුම්කරුවන්ට තිබිය යුතු වේ.

නිරීක්ෂණය වූ පොදු වැරදි කිහිපයක් පහත දැක්වේ:

(1) බොහෝ අයදුම්කරුවන් හවුල්කරුවන්ගේ වැටුප් නිවැරදිව ගණනයකොට නොතිබුණි. ප්‍රශ්නයේ දී ඇත්තේ මාසික වැටුප වන අතර, වාර්ෂික වැටුප ගණනය කර නොමැත.

(2) ප්‍රශ්නය අනුව, හවුල්කරුවන් දෙදෙනෙකු පමණක් වැටුප් සඳහා හිමිකම් ලබන නමුත් සමහරු සියලු හවුල්කරුවන් සඳහා වැටුප් ගණනය කර තිබුණි.

(3) සමහර අයදුම්කරුවන් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වල ආරම්භක ශේෂ නිවැරදිව ඇතුලත් කර නොතිබුණි. ප්‍රශ්නයේ එක් බැර ශේෂයක් ද, හර ශේෂ දෙකක්ද දී තිබුණු නමුත් සියලු ශේෂ එකම ස්ථානයක ඇතුලත් කර තිබුණි.

(4) බොහෝ අයදුම්කරුවන් ලාභ කොටස ගණනය කිරීම සඳහා පෙරවැඩ පෙන්වා නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

# <u>D කොටස</u>

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

සීමිත පෞද්ගලික සමාගමක කළමණාකාරිත්වයේ භාවිතය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම අපේක්ෂා කරන ලදි. ගිණුම්කරණ ප්‍රමිත, ද්විත්ව සටහන් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක් කෙරිණි.

නිරීක්ෂණය වූ පොදු වැරදි කිහිපයක් පහත දැක්වේ:

(1) සමහරු ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා නිවැරදි ආකෘතිය භාවිත කර නොතිබුණි.

(2) සමහර අයදුම්කරුවන් ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වැඩිවීම සහ ණයකර පොලිය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(3) අයදුම්කරුවන් බහුතරය නව යන්ත්‍රය ස්ථාපිත කිරීමේ පිරිවැය ප්‍රාග්ධනීත කර නොතිබුණි. එසේම මිලටගත් යන්ත්‍රය සඳහා ගෙවිය යුතු මුදල සහ ස්ථාපනය කිරීමේ පිරිවැය නිසියාකාරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(4) සමහර අයදුම්කරුවන් වත්කම් ක්ෂය නිවැරදිව පෙරවැඩවල ගණනය කර තිබුණද ඒවා මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ස්ථානවලට ගෙන නොතිබුණි.

(5) සමහර අයදුම්කරුවන් උපචිත වියදම් පෙරවැඩවල දක්වා තිබුණද සටහන් නිසියාකාරව පෙන්වා නොතිබුණි. සුළු පිරිසක් කලින් ගෙවූ වියදම් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(6) සුළු පිරිසක් ගෙවූ ආදායම් බදු වෙනත් වියදම් යටතේ පෙන්වා තිබුණි.

(7) සමහර අයදුම්කරුවන් පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ වියදම් සඳහා විස්තරාත්මක පෙරවැඩ පෙන්වා නොතිබූ අතර, එමනිසා, ඔවුන් ලකුණු කිහිපයක් ලබාගැනීමට අසමත් විය.

(8) කෙටිකාලීන ආයෝජන (මාස 6 ස්ථාවර තැන්පතු) ජංගම වත්කම් යටතේ දක්වනු වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(9) ගැලපුම්වලට අදාලවන සංඛ්‍යාවන් දහස්වලින් පෙන්වීමට ඇතැම් අයදුම්කරුවන් අසමත් වී තිබුණි. ශේෂ පිරික්සුමේ ඇති අගයන් දක්වා ඇත්තේ දහස් වලිනි. අයදුම්කරුවන් නිසියාකාරව ප්‍රශ්නය කියවා නොමැත.

(10) 2019 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා දීමනාව රු.123,000/- ක් වුවද සමහරු ආරම්භක ශේෂය වූ රු.57,000/- ට රු.123,000/- (එකතුව රු.180,000/-) එකතුකර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

\- - -

**අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේදී සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණු:**

1. **විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් ඇතිකර ගැනීම.**

2. **අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙරවැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.**

3. **උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.**

4. **අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.**

5. **ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.**

6. **අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද දියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න ප්‍රත සහ යෝජිත පිළිතුරු උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යූහයන් නැවතත් ප්‍රශ්න පත්‍රයන් තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.**

7. **මෙම විෂයට අදාළව ගිණුම්කරණ ප්‍රමිත, ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.**

8. **කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, පිළිතුරු සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.**

9. **විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.**

\- * * * -